# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1787/14 - 2012 දෙසැම්බර් මස 03 වැනි සඳුදා - 2012.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක 04 දරන "වයඹ නිවාස සහ ඉදිකිරීම්" පිළිබඳ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2012.10.16 වැනි දින සම්මත කරන ලදුව, 2012.10.24 වැනි දින වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කෙරේ.

පී. බී. එම්. සිරිසේන,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2012 නොවැම්බර් මස 26 වැනි දින,
කුරුණෑගල වයඹ පළාත් සභාවේ
සභා කාර්යාලයේ දී ය.

#### වයඹ මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

වයඹ පළාතේ නිවාස සහ ඉදිකිරීම් ව්‍යාපෘති කටයුතු හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ව්‍යවස්ථාපිතව පැවරී ඇති රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා ද, වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල පිහිටුවීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක 04 දරන නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට මෙය බලාත්මක වන්නේ ය. (ලුහුඩුනාමය හා ක්‍රියාත්මක දිනය.)

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත පරිදි වේ : (අරමුණු.)

(i) ජාතික නිවාස ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාත තුළ නිවාස සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම ;

(ii) නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල පිහිටුවීම ;

(iii) වයඹ පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුව පිහිටුවීම.

## *පළමුවැනි කොටස*

### *වයඹ පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ සංයුතිය හා කාර්යභාරය*

පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුව පිහිටුවීම.

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කරගනු පිණිස සහ ඊට අදාළ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුත්තේ ය.

දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව.

4. (i) දෙපාර්තමේන්තුව අවිච්ඡින්නව හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් නිවාස සහ ඉදිකිරීම් විෂය ක්ෂේත්‍රයට අදාල සියලු කටයුතු ඉටුකිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති නීතිගත ආයතනයක් බවට පත්වන්නේ ය.

(ii) මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු රජයේ හා පළාත් සභාවේ ආයතන සංග්‍රහය හා මුල්‍ය රීති සංග්‍රහයන්හි විධිවිධාන වලට යටත් වේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියා.

5. පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාක්මක කිරීම සඳහා පළාත් නිවාස කොමසාරිස්වරයා සිටිය යුතු ය. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පංතියේ නිලධාරියෙකු විය යුතු අතර, විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කල යුතු වන්නේ ය. නිවාස කොමසාරිස්වරයා අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණයට හා පරිපාලනයට යටත් වන්නේ ය.

6. පළාත් නිවාස කොමසාරිස්වරයා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, ඔහුට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සහාය කාර්යය මණ්ඩලයක් ද සිටිය යුතු ය. දැනට සේවයේ නියුතු කොමසාරිස්වරයා ඇතුළු කාර්යය මණ්ඩලය මේ සඳහා ස්ථාපිත කාර්ය මණ්ඩලය සේ සැලකිය යුතු ය. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ කොමසාරිස්වරයාට පැවරෙණ බලතල හා කර්තව්‍යයන් අදාළ පරිදි කාර්යය මණ්ඩලයට පැවරිය හැකි ය.

කාර්යය මණ්ඩලයේ වැටුප් හා වේතන.

7. පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය.

දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය.

8. කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන දෙපාර්තමේන්වේ කාර්ය භාරය දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය පහත පරිදි වේ.

(i) ජාතික ප්‍රතිපත්තියට අනුකුලව වයඹ පළාතේ නිවාස සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම හා නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ කටයුතු පවත්වා ගෙන යාම ;

(ii) මහල් නිවාස නිල නිවාස හෝ වෙනත් අධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති, නිවාස ණය සහ ගොඩනැගිලි උපකරණ සැපයීම ඇතුළුව පළාත්බද නිවාස සංවර්ධන වැඩ සටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම ;

(iii) කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ පනතට සහ ගෙවල්කුලී පනතට අදාල කටයුතු වයඹ පළාත තුළ ක්‍රියාත්මක කිරීම ;

(iv) 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නවවන උපලේඛනයේ පළමුවන ලැයිස්තුවේ 5:3 යටතේ දක්වා ඇති විෂයයන් හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු කිරීම ;

(v) නිවාස හිඟය අඩුකිරීම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට අදාලව සැලසුම් සකස් කිරීම, දේපල අත්පත් කරගැනීම, අධිකරණ නියෝග ලබා ගැනීම හා ඒ අනුව කටයුතු කිරීම ;

(vi) පළාත තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ණය පහසුකම්, මුල්‍ය හා ද්‍රව්‍යමය ආධාර සැපයීම ;

(vii) දෙපාර්තමේන්තුවේ අරමුණු අතරින් කිසිවක් ඉටුකර ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම ;

(viii) නිවාස ඉදිකිරීම සඳහා යම් තැනැත්තකුට ඉඩම් ලබාදීම, නිවාස සංවර්ධනයේ සියලු අංශවලට අදාල වන ක්‍රියාකාරකම්හි නිරතවීම, ඒවාට අනුබලදීම සහ එකී ක්‍රියාකාරකම්හි යෙදෙන ආයතන ලියාපදිංචි කිරීම, සම්බන්ධීකරණය සහ පසු විපරම් කිරීම ;

(ix) සුළු හා මධ්‍යම පරිමාණ නිවාස යෝජනා ක්‍රම ආරම්භ කිරීම, පවතින යෝජනා ක්‍රම පවත්වාගෙන යාම, අධීක්ෂණය සහ පසු විපරම ;

(x) දෙපාර්තමේන්තුවේ අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීමට අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියලු ක්‍රියාකාරකම්.

*දෙවැනි කොටස*

*වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල පිහිටුවීම*

9. (i) වයඹ පළාතේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල නමින් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවන ලැබිය යුතු අතර, එම අරමුදල වයඹ පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තු යටතේ පවත්වාගෙන යා යුත්තේ ය. අරමුදල පිහිටුවීම

(ii) මෙම අරමුදලේ කාර්යයන් සඳහා වයඹ පළාත් සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් මුදල් වෙන්කර දිය යුත්තේ ය.

10. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාතේ නිවාස සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමෙහිලා දෙපාර්තමේන්තුව විසින් අරමුණු කරනු ලබන සහ අරමුදල වෙත යොමුකරනු ලබන නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ පරමාර්ථ සාක්ෂාත් කරදීම අරමුදලේ අරමුණු හා කාර්යභාරය වන්නේ ය. අරමුදලේ අරමුණු හා කාර්ය භාරය

11. අරමුදල අවිච්ඡින්න හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද, දේපල, ඉඩකඩම්, වාහන, යන්ත්‍රෝපකරණ හා උපකරණ සන්තකයට ගැනීමට ද, හිමිකම ලැබීමට ද, ඒවා නියාදනය කිරීමට ද, බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත්වන්නේ ය. අරමුදල නීතිගත සංස්ථාවක් බව

12. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අතුරින් මෙම අරමුදලේ කාර්ය මණ්ඩලය පත් කළ හැක්කේ ය. අරමුදල සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් අවශ්‍ය වූ විටක දී පාලක මණ්ඩලයේ නිර්දේශය මත වයඹ පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය සහිතව තීරණය කරනු ලබන ගාස්තු ගෙවා එම සේවාවන් ලබාගත හැක්කේ ය. අරමුදලේ කාර්ය මණ්ඩලය හා විශේෂඥ සේවා

13. මෙහි මින්මතු පාලක මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන සාමාජිකයින් හත් දෙනකුගෙන් යුත් පාලක මණ්ඩලයක් මගින් අරමුදල පාලනය විය යුතු අතර, එම මණ්ඩලය මෙහි පහත දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත්කළ යුතු ය. පාලක මණ්ඩලය

(i) වයඹ පළතේ නිවාස සහ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) වයඹ පළාත් සභාවේ මුදල් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නිල තත්ත්වය මත ඔහු විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයෙක් ;

(iii) වයඹ පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා (මුල්‍ය) ;

(iv) වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා ;

(v) පළාත් නිවාස සහ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, කළමනාකරණය, සැලසුම්කරණය සහ නීතිය යන ක්ෂේත්‍රයන්හි විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති පුද්ගලයින් තිදෙනෙක්.

14. පළාත් නිවාස සහ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිළ බලයෙන් අරමුදලේ සභාපති වේ. අරමුදලේ සභාපති

15. පළාත් නිවාස කොමසාරිස්වරයා නිල බලයෙන් අරමුදලේ ලේකම් වන්නේ ය. පාලක මණ්ඩල රැස්වීම් වලට අරමුදලේ ලේකම්වරයා කැඳවුම්කරු වන අතර, ඔහුට ඡන්ද බලය හිමි නොවේ. අරමුදලේ ලේකම්

16. පාලක මණ්ඩලය විසින් කාරක සභා සහ උපදේශක මණ්ඩල පත්කරනු ලැබිය හැකි අතර, විශේෂ විෂයයක් හෝ වගකීමක් හෝ කාර්යයක් හෝ ඒවාට පැවරිය හැකි ය. පාලක මණ්ඩලයේ කාර්යයන් සඳහා පත්කිරීම්

17. අරමුදලේ බලතල පහත පරිදි වේ : අරමුදලේ බලතල

(i) අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන යම් නිශ්චල හෝ චංචල දේපළක් මිළයට ගැනීම හෝ අන් අයුරකින් සන්තකයට ගැනීම, දැරීම ආදියට අරමුදලේ පාලක මණ්ඩලය වෙත බලය ඇත්තේ ය ;

(ii) බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ දී, ඇප ඇතිව හෝ ඇප නැතිව මුදල් ණයට ගැනීම සහ ලබාගැනීමට ද, සම්මාදම් මුදල්, ආධාර මුදල් හෝ දේශීය/ජාත්‍යන්තර පරිත්‍යාග භාරගැනීම සහ එකතු කිරීමට ද, අරමුදලට බලය ඇත්තේ ය ;

(iii) අරමුදලේ පරමාර්ථ සාධනය කිරීමට අවශ්‍ය වන හෝ යෝග්‍ය වන හෝ සියළුම කාර්යයන් ඉටුකිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය පාලක මණ්ඩලයට ඇත්තේ ය.

පාලක මණ්ඩලයේ නිල කාලය

18. පාලක මණ්ඩල සඳහා පත්කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය වසර 03ක් විය යුතු ය. එම ධූර කාලය සම්පූර්ණ කර ඉවත්ව යන සාමාජිකයින් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි නැවත පත්කළ හැකි ය. නිල තනතුරු හේතුවෙන් පාලක මණ්ඩලයේ සාමාජිකයින් වන අයවළුන්ගේ ධූරකාලය අදාළ නිලය දරණ තාක් කල් පැවතිය යුතු ය. එම නිලය දැරීම අවසන් වීමත් සමඟම ඔහුගේ/ඇයගේ සාමාජිකත්වය අහෝසි වන අතර, අනුප්‍රාප්තික තැනැත්තා/තැනැත්තිය ඒ සඳහා නැවත පත්කළ යුතු ය.

පාලක මණ්ඩලයේ ඉල්ලා අස්වීම/ ඉවත් කිරීම

19. අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලිඛිත ඉල්ලීමක් මගින් නිල තත්වය මත පත්කරන සාමාජිකයෙකුට හැර වෙනත් ඕනෑම සාමාජිකයෙකුට සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට හැකියාව ඇත්තේය. යම් සාමාජිකයකු ඉවත් කිරීමට අවශ්‍ය වේ යැයි අමාත්‍යවරයාට හැඟී යන්නේ නම් නිල තත්වය මත පත්කල අයවළුන් හැරෙන්නට සෙසු සාමාජිකයින් පාලක මණ්ඩලයෙන් ඉවත් කිරීමේ බලය අමාත්‍යවරයාට ඇති අතර, එසේ ඉවත් වන හෝ ඉවත් කරනු ලබන තැනැත්තා වෙනුවට පත්කරණ සාමාජිකයාට පූර්වයෙන් සිටි සාමාජිකයාගේ ඉතිරි නිල කාලය හිමි වන්නේ ය.

පලක මණ්ඩලය සඳහා සුදුසුකම්

20. (i) සිහි විකල් තැනැත්තෙකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු හෝ දණ්ඩ නීති සංග්‍රහය යටතේ නැතහොත් අල්ලස් පනත යටතේ වරදකරුවෙකු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබ සිටින පුද්ගලයෙකු.

(ii) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයෙකු හෝ වශයෙන් ධූර දරන තැනැත්තෙකු.

අරමුදලේ ලේකම්ගේ කාර්යභාරය

21. අරමුදලේ එදිනෙදා සියළුම පරිපාලන කටයුතු පිළිබඳව ලේකම්වරයා වගකිවයුතු වේ. ලේකම්වරයා විසින් අරමුදලේ වෙනත් විධි විධානවලට යටත්ව පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබිය හැක්කේ ය.

(i) අරමුදලේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම, නීතිමය කටයුතු සිදු කිරීම ;

(ii) පාලක මණ්ඩලය විසින් ලේකම්වරයාට පවරණු ලැබිය හැකි කාර්යයන් හා කටයුතු ඉටුකිරීම හා ක්‍රියාත්මක කිරීම.

පාලක මණ්ඩලයේ මුලසුන

22. සභාපතිවරයා පාලක මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුවේ. සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක සෙසු නිල සාමාජිකයින් අතරින් තාවකාලික ව තෝරා ගන්නා අයෙකු රැස්වීමේ මුලසුන දැරිය හැකි වන්නේ ය.

පාලක මණ්ඩල දීමනා

23. පාලක මණ්ඩලයේ දීමනා අදාළ අමාත්‍යවරයාගේ නිර්දේශය මත වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

පාලක මණ්ඩල රැස්වීම් සහ ගණපූරණය

24. (i) අරමුදලේ පාලක මණ්ඩලය අවම වශයෙන් මසකට එක් වරක්වත් රැස්විය යුතු ය. විශේෂ හෝ අත්‍යාවශ්‍ය යයි හැඟී යන ඕනෑම අවස්ථාවක දී පාලක මණ්ඩලයේ රැස්වීමක් කැඳවීම සඳහා සභාපතිවරයාට බලය ඇත.

(ii) පාලක මණ්ඩලයේ රැස්වීමක් කැඳවන ලෙස අවම වශයෙන් එහි සාමාජිකයින්ගෙන් 4 දෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් ඉල්ලා සිටියහොත් එම ඉල්ලීම ලැබී දින 07ක් ඇතුළත විශේෂ රැස්වීමක් කැඳවීමට සභාපතිවරයා විසින් ලේකම්වරයා වෙත නියෝග කළ හැකි ය.

(iii) පාලක මණ්ඩලය විසින් ගනු ලබන තීරණ බහුතර ඡන්දයෙන් විය යුතු ය. කැමැත්ත විමසීමේ දී පක්ෂව හා විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව සමාන වේ නම් සභාපතිවරයාට හෝ මූලාසනය දරන්නාට හෝ තමාගේ ඡන්දය තීරක ඡන්දයක් ලෙස භාවිතා කළ හැකි ය.

(iv) පාලක මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල කටයුතු කරගෙනයාම පිණිස මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව කාර්ය පටිපාටි සකස් කරගත හැකි ය. සියළුම රැස්වීම් වාර්තා හා තීරණ ලේඛනගත කිරීමට කටයුතු කළයුතු අතර, පැමිණි සාමාජිකයින් එහි අත්සන් කළ යුතු ය.

(v) පාලක මණ්ඩලයේ සභාපතිවරයාගේ හෝ සාමාජිකයෙකුගේ පත්වීමක දෝෂයක් නිසා පාලක මණ්ඩලය ගනු ලබන තීරණයක් හෝ කවර කරුණක් හෝ බලරහිත නොවිය යුතු ය.

(vi) පාලක මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකි. සාමාජිකයින්ගේ පුරප්පාඩු පැවතීම කමිටු රැස්වීම් පැවැත්වීමට හෝ රැස්වීම්වල තීරණ ගැනීම සඳහා බාධාවක් නොවන්නේ ය.

25. අරමුදලේ සංයුතිය පහත පරිදි වේ. අරමුදලේ සංයුතිය

(i) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා වාර්ෂිකව අයවැය ලේඛනයෙන් හා වයඹ පළාත් සභාව විසින් වරින් වර වෙන්කර දෙන මුදල් ;

(ii) භාණ්ඩාගාරය විසින් කලින් කල වෙන්කර දෙනු ලබන සියළු මුදල් ;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අයවැය යටතේ ලබාදෙන විමධ්‍යගත මුදල් සහ පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් ආයෝජන යටතේ ලබාදෙන මුදල් ;

(iv) ප්‍රදර්ශන, අලෙවිසැල්, ලොතරැයි හෝ එවැනි කටයුතුවලින් ලැබෙන මුදල් ;

(v) 1972 අංක 7 දරන ගෙවල්කුලී පනත ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලැබෙන මුදල් ;

(vi) උපලබ්ධි ලාභ හෝ පොළී මුදල් ;

(vii) අරමුදලේ බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යය හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අරමුදල වෙත ලැබෙන සියළු මුදල් ;

(viii) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර හෝ නිත්‍යානුකූල ප්‍රභවයන්ගෙන් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ආධාර මුදල් වශයෙන් අරමුදලට ලැබනෙ සියළු මුදල් සහ පවරනු ලබන සියළු චංචල හා නිශ්චල දේපල ;

(ix) රේඛීය අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන, යම් රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ඕනෑම ආයතනයක් විසින් අරමුදලට පවරනු ලබන සියළු මුදල් හා චංචල, නිශ්චල දේපල ;

(x) පළාත් පාලන ආයතන විසින් ලබාදෙන මුදල් ;

(xi) පාලක මණ්ඩලය විසින් සුදුසුයයි තීරණක කරනු ලබන ඕනෑම ප්‍රභවයකින් ලැබෙන මුදල්.

26. අරමුදලේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්යයන් ඉටුකිරීමේ දී සහ කර්තව්‍යයන් කිරීමේ දී දැරීමට සිදුවන සියළු වියදම් සඳහා අවශ්‍යවන්නා වූ සියළු මුදල් ප්‍රමාණයන් ද මෙම ප්‍රඥප්තිය මගින් හෝ නියෝග යටතේ හෝ අරමුදලින් ගෙවිය යුතු වන මුදල් ප්‍රමාණයන් ද අරමුදලට වැයබරක් වන්නේ ය. අරමුදලින් වියදම් දැරීම

27. (i) මෙම අරමුදල සඳහා ගිණුමක් තිබිය යුතු ය. එම ගිණුමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යා යුතු ය. අරමුදලට ලැබෙන සියළුම මුදල් මෙම ගිණුමට බැරකල යුතු ය. අරමුදලේ ගිණුම සහ මුදල් ආයෝජනය කිරීම

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී වහාම අවශ්‍ය නොවන්නා වූ අරමුදලේ සියළු මුදල්, පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි රාජ්‍ය බැංකුවක ආයෝජනය කළ යුතු ය.

28. අරමුදලේ අරමුණු සපුරා ගැනීම පිණිස ඇති බලතල හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම පිණිස පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි අරමුදලේ මුදල් යොදා ගත හැකි ය. වියදම් සඳහා අනුමැතිය

අරමුදලේ වාර්ෂික ගිණුම්.

29. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් අරමුදලේ ආදායම් හා වියදම් පිළිබඳවත් සියළු ගනුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීමට පාලක මණ්ඩලය විසින් කටයුතු යෙදිය යුතු අතර, සිය ව්‍යාපෘති කටයුතුවලට අදාළව ගිණුම් ඇතුළත් වාර්ෂික මුදල් ප්‍රකාශයක් සකස් කළ යුතු ය.

අරමුදලේ මුදල් වර්ෂය.

30. අරමුදලේ මුදල් වර්ෂය ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වේ.

අරමුදලේ ගිණුම් විගණනය.

31. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් අරමුදලේ වාර්ෂික ගිණුම් වාර්තාව පිළියෙල කර ප්‍රසිද්ධ කල යුතු ය. එම ගිණුම් වාර්තාව පළාත් සභාවේ අභ්‍යන්තර අංශයේ විගණනයට යටත් වේ.

අරමුදලේ ගිණුම් විගණනය සඳහා විගණකාධිපතිවරයා සතු බලතල.

32. සෑම වර්ෂයකම අරමුදලේ ගිණුම් විගණනනය කිරීම සඳහා විගණකාධිපති වරයාට බලය ඇත්තේ ය.

ගිණුම් විගණනය සඳහා පිරිවැය.

33. අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා දරනු ලබන වියදම් පියවීමට පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදලක් මෙම අරමුදලෙන් ගෙවිය හැක්කේ ය.

අරමුදලේ වාර්ෂික වාර්තාව පළාත් සභාවට ඉදිරිපත් කිරීම.

34. විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද ගිණුම් වාර්තාව සමග අදාළ මුදල් වර්ෂය තුළ දී අරමුදල විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් පාලක මණ්ඩලයේ අනුමැතිය මත අරමුදලේ ලේකම් විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අදාළ මුදල් වර්ෂය ඉකුත් වී මාස 06ක් ගතවීමට පෙර අමාත්‍යවරයා විසින් එය පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු ය.

## *තුන්වැනි කොටස*

### *පොදු විධිවිධාන*

අරමුදලේ පොදු මුද්‍රාව.

35. අරමුදල් සඳහා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය අරමුදලේ ලේකම් භාරයේ තිබිය යුතු ය.

පොදු මුද්‍රාව භාවිතා කිරීම.

36. අරමුදලේ සභාපතිවරයා, ලේකම්වරයා, ගණකාධිකාරිවරයා ඉදිරියේ දී හැර අරමුදලේ පොදු මුද්‍රාව යම් සාදන පත්‍රයක හෝ ලියවිල්ලක නොයෙදිය යුතු අතර, ඉහත සඳහන් නියෝජිතයන් එම අවස්ථාවේ එහි සිටි බව තහවුරු කිරීම සඳහා එම සාදන පත්‍රයෙහි නැතහොත් ලියවිල්ලෙහි තම අත්සන යෙදිය යුතු ය.

පොදු මුද්‍රාව යෙදූ ලියවිලි පිළිබඳ ලේඛන.

37. අරමුදලේ පොදු මුද්‍රාව යොදන ලද සාදන පත්‍ර හෝ ලියවිලි හෝ පිළිබඳ ලේඛනයක් අරමුදලේ ලේකම් විසින් පවත්වා ගෙන යා යුතු ය.

අමාත්‍යවරයා සතු බලතල.

38. සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා රාජකාරියෙහි සිය වගකීම් ඉටුකිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට පොදු හෝ නිශ්චිත උපදෙස් හෝ නියෝග නිකුත් කල හැකි ය. එම උපදෙස් හෝ නියෝග ක්‍රියාත්මක කිරීමට පාලක මණ්ඩලය සහ දෙපාර්තමේන්තුව බැඳී සිටී.

අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව.

39. මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන හා අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියෝග පැනවිය යුතුයැයි මෙම ප්‍රඥප්තියෙහි නියම කර ඇති යම් කරුණක් ක්‍රියාත්මක කිරීම සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි වේ.

නියෝග ගැසට් පත්‍රයේ පළකළ යුතු බව.

40. (*i*) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

(*ii*) *ගැසට් පත්‍රයේ* පලවූ නියෝග හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතු ය.

(*iii*) අනුමත කරනු නොලැබූ නියෝගයක් වෙතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කලා සේ සැලකිය යුතු වුවත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියාමාර්ගයක් කෙරෙහි එම අවලංගුවීම බලනොපෑ යුතු ය.

(*iv*) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් මේ අයුරින් අවලංගු වූවා සේ සැලකීමට සිදු වුවහොත් එසේ සැලකිය යුත්තේ කවර දිනක සිට ද යන්න දැන්වීමක් මගින් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

41. අරමුදල සඳහා යොදා ගනු ලබන සියළුම සාමාජිකයින් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයෙහි සඳහන් අර්ථානුකූලව සිය ධුර කාලය තුළ "රාජ්‍ය සේවකයන්" ලෙස සැළකිය යුතු ය.

අරමුදලේ සාමාජිකයින් හා සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකීම.

42. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

43. මෙම ප්‍රඥප්තියෙහි අන්‍ය ආකාරයකින් සඳහන් වුවහොත් මිස :

අර්ථ නිරූපණ.

(i) "පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද ;

(ii) "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් විෂය භාර අමාත්‍යවරයා ද ;

(iii) "දෙපාර්තමේන්තුව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුව ද ;

(iv) "කොමසාරිස්වරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ද ;

(v) "අරමුදල" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල ද ;

(vi) "පාලක මණ්ඩලය" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ පාලක මණ්ඩලය ද ;

(vii) "සභාපති" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ සභාපතිවරයා ද ;

(viii) "ලේකම්" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ ලේකම්වරයා ද ;

(ix) "රාජ්‍ය බැංකුව" යන්නෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ද අදහස් කෙරේ.

12 - 449

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.